*සැ. යු.* - 2024.05.10 දින පළ වූ අංක 2384 *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,386 - 2024 මැයි මස 22 වැනි බදාදා - 2024.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 154 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 156 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ජූනි මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි මස 31 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# නොතාරිස් ලැයිස්තුව

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

අවිස්සාවේල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ ලංකේශ්වර විල්මට් සේතුංග මහතාගේ 2022.12.31 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

05-264

---

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ වික්‍රමසිංහ වාසල ඒකනායක මුදියන්සේලාගේ විමලධර්ම ඒකනායක මහතාගේ 2022.10.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

05-265

---

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ හේරත් මුදියන්සේලාගේ දොන් ජයන්ත පෙරේරා මහතාගේ 2023.03.20 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

05-266

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

මාතර මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ කරුණාදාස එදිරිවීර මහතාගේ 2023.01.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

05-267

---

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

මහනුවර මහාධිකරණ කලාපය තුළ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ නේසරාජා මහේන්ද්‍රරාජා මහතාගේ 2023.10.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.

05-268

---

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කුරුණෑගල මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ මහමාලගේ ජෝශප් නිමල් ඩන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ 2023.12.31 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.

05-269

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

රත්නපුර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ කිරිමුර ලියනගේ කරුණාදාස මහතා 2023.06.20 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.

05-270

---

# විවිධ දැන්වීම්

**බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය**

(කොළඹ පිහිටි සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

දෙහිවල, පල්ලිදොර පාර, අංක 107 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි පැරඩම් ක්ලෝතින් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (Paradigm Clothing (Private) Limited (PV 1608) ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණාවේ දී ය.

නඩු අංකය : 26/2024/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

1. දීපන් අම්රතලාල් අමලීන්,
අංක 10, ගොරකගහ ඇවනිව්,
කොළඹ 06.

2. ප්‍රශාන්ත් මහේන්ද්‍ර අමලීන්,
අංක 149, සුවිසුද්ධාරාම පාර,
කොළඹ 06.

........................*පෙත්සම්කරුවන්.*

බස්නාහිර පළාත්බද මහාධිකරණය (කොළඹ පිහිටි සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) විසින් ඉහත නම සඳහන් පැරඩම් ක්ලෝතින් ප්‍රයිවට් ලිමිටඩ් (PV 16068) ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 06, සුවිසුද්ධාරාම පාර, අංක 149 හි ප්‍රශාන්ත් මහේන්ද්‍ර අමලීන් සහ කොළඹ 06, ගොරකගහ ඇවනිව්, අංක 10 හි පදිංචි දීපන් අම්රතලාල් අමලීන් යන අය විසින් **වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 02** වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කළ බවත්, එකී පෙත්සම **වර්ෂ 2024 ජූනි මස 18** වැනි දින අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කරන ලද බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණයහිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥවරයෙකු හෝ ලේඛණගත නීතිඥවරයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බවත්, මෙයින් දන්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටින ණය හිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

රන්වන්ගොන්නගේ නතාලි ෂෙනෙල් ලිවේරා,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
අංක 367 4/1, වේල්ල වීදිය,
කොළඹ 12.

දුරකථන : 0112-544400

***සටහන*** : එකී පෙත්සම ඇසීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් නීතිඥ රන්වන්ගොන්නගේ නතාලි ෂෙනෙල් ලිවේරා වෙත ලිඛිතව හෝ පැමිණ හෝ තැපැල් මගින් භාරදිය යුතුය. පුද්ගලයින්ගේ නම් එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එම පුද්ගලයා හෝ ව්‍යාපාරික ආයතනය හෝ සිය නීතිඥවරුන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය වර්ෂ **2024ක් වූ ජූනි මස 15 වැනි දින පස්වරු හයට (ප. ව. 6.00)** පෙර ඉහත නම සඳහන් නීතිඥවරිය වෙත ලැබෙන සේ කල්වේලා ඇතිව භාරදීම හෝ තැපැල් කිරීම අවශ්‍ය වේ.

රන්වන්ගොන්නගේ නතාලි ෂෙනෙල් ලිවේරා,
පෙත්සම්කාර සමාගමේ ලේඛනගත නීතිඥ.

05-275

---

## පාර්ලිමේන්තුව

### ජාත්‍යන්තර මානව හිමිකම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මේජර් ප්‍රදීප් උඳුගොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ජාත්‍යන්තර මානව හිමිකම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සභාව සංස්ථාගත කිරීමයි :-

*(අ)* තිරසාර ජීවන පිළිවෙත්, සංරක්ෂණය සහ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සුරැකීමේ වැදගත්කම පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම ;

*(ආ)* ශ්‍රී ලාංකීය උරුමයන් ගෝලීය වශයෙන් ප්‍රදර්ශනය කිරීම සඳහා සංස්කෘතික උත්සව, චිත්‍ර ප්‍රදර්ශන සහ හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම, මෙය සංස්කෘතික අවබෝධය සහ අගය කිරීම ප්‍රවර්ධනය කරයි ;

*(ඇ)* අන්තර් සංස්කෘතික සහයෝගීතාව ප්‍රවර්ධනය කරන ඒකාබද්ධ මුලපිරීම්, ප්‍රදර්ශන සහ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර සංස්කෘතික සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම ;

යනාදිය වේ.

මේජර් ප්‍රදීප් උඳුගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

05-277

## පාර්ලිමේන්තුව

### එක්සත් මානව හිමිකම් සුරැකීමේ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මේජර් ප්‍රදීප් උඳුගොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "එක්සත් මානව හිමිකම් සුරැකීමේ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංවිධානය සංස්ථාගත කිරීමයි :-

*(අ)* අත්‍යාවශ්‍ය සැපයුම් බෙදා හැරීම, තාවකාලික නවාතැන් සහ වෛද්‍ය ආධාර ඇතුළුව අර්බුද කාලවල දී ක්ෂණික සහන සැපයීම සඳහා ඉක්මන් ප්‍රතිචාර පද්ධතියක් සංවර්ධනය කිරීම ;

*(ආ)* දැනුම්වත් කිරීමේ ව්‍යාපාර හරහා මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටීම සහ මානව හිමිකම් කඩවීම්වලට මුහුණ දෙන පුද්ගලයන් සඳහා නීති ආධාර සහ සහාය ලබා දීම, නීති විශේෂඥයින් සහ සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කිරීම මෙයට ඇතුළත් වේ ;

*(ඇ)* ගෞරවය, ඉවසීම සහ සමානාත්මතාවයේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින්, මානව හිමිකම් ගැටළු පිළිබඳ පුළුල් ව දැනුම්වත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම ;

යනාදිය වේ.

මේජර් ප්‍රදීප් උඳුගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

05-276